**2019 අංක 01 දරන නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සඳහා සැක සහිත ගනුදෙනු වාර්තාකිරීම පිලිබඳ මාර්ගෝපදේශ**

**හැඳින්වීම**

1. මෙම මාර්ගෝපදේශ සංග්‍රහය 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ (මෙහි මින්මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 15 (1) (ච) වගන්තියට අනුකූලව නිකුත් කරනු ලබන අතර, පනතේ 33 වන වගන්තියෙන් අර්ථ දක්වා ඇති නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සඳහා අදාල විය යුතුය.

2. පනතෙහි 33 වන වගන්තියේ අර්ථ දක්වා ඇති පරිදි නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයන්හි නියැලී සිටින ආයතනවලට 2017, අප්‍රේල් 21 දින අංක 2015/56 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ නිකුත් කර ඇති 2017 සැක කටයුතු ගනුදෙනු (ආකෘති) නියෝග අර්ථ නිරූපණය කිරීමට සහ අදාල කර ගැනීමට මෙම මාර්ගෝපදේශ සංග්‍රහය උපකාර කරයි.

3. මෙම මාර්ගෝපදේශ සංග්‍රහය නිරවශේෂයෙන්ම සවිස්තරාත්මක යැයි අදහස් නොකරන අතර මූල්‍ය බුද්ධි ඒකකයෙන් ලද නෛතික උපදෙස් ලෙස අර්ථකථනය නොකල යුතු වේ.

**නෛතික බැඳීම්**

4. පනතෙහි 7 වන වගන්තිය ප්‍රකාරව, සියලුම "ආයතන" විසින් සැකකටයුතු ගනුදෙනු මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කල යුතු වේ. යම් මූල්‍ය ව්‍යාපාරයක හෝ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක නිරත වූ හෝ එවැනි ව්‍යාපාරයක් කරගෙන යනු ලබන යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් "ආයතන" ලෙස අර්ථ දක්වයි. පහත ව්‍යාපාර හා වෘත්තීන් පනතෙහි 33 වන වගන්තියේ අර්ථ දක්වා ඇති නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර වේ.

අ. කැසිනෝ, සූදූ ගෙවල් හෝ තම ගනුදෙනුකරුවන් නියමිත සීමාවට සමානව හෝ එය ඉක්මවා, මූල්‍යමය ගනුදෙනුවල යෙදී සිටින විට, අන්තර්ජාලය මගින් එවැනි යම් ව්‍යාපාරයක් කරගෙන යන තැනැත්තෙකු ද ඇතුළුව ලොතරැයියක් පවත්වාගෙන යාම.

ආ. නිශ්චල දේපළ මිලට ගැනීම හා විකිණීමට අදාලව, තම සේවාදායකයන් සඳහා ගනුදෙනුවල යෙදුණු නිශ්චල දේපළ අනුයෝජිතයන්.

ඇ. නියමිත සීමාවට සමානව හෝ එය ඉක්මවා, ගනුදෙනුකරුවකු, සමග මුදල් ගනුදෙනුවල නිරතවන විට, 1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ පනතින් ආවරණය වන ලෝහ හා ගල් ඇතුළුව, එහෙත් ඒවාට සීමා නොවූ, වටිනා ලෝහ වෙළෙඳුන් සහ මැණික් ගල් හා අඩ මැණික් ගල් වෙළෙඳුන්.

ඈ. පහත දැක්වෙන කටයුතු අතුරෙන් කිසිවකට අදාළව, තම සේවාදායකයන් වෙනුවෙන් ගනුදෙනු සඳහා සූදානම් වනවිට හෝ ඒවා කරගෙන යන විට, නීතිඥවරුන්, නොතාරිස්වරුන්, වෙනත් ස්වාධීන නීති වෘත්තිකයන් හා ගණකාධිකාරිවරුන්: -

(i) නිශ්චල දේපල මිලට ගැනීම හා විකිණීම;

(ii) සේවාදායක මුදල්, ඇප හෝ වෙනත් වත්කම් කළමනාකරණය;

(iii) බැංකුවේ ඉතිරිකරගත් මුදල් හෝ ඇප ගිණුම් කළමනාකරණය කිරීම;

(iv) සමාගම් ඇති කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ කළමනාකරණය කිරීම සඳහා දායක මුදල් සංවිධානය කිරීම; සහ

(v) නෛතික පුද්ගලයන් ඇති කිරීම, මෙහෙයවීම හෝ කළමනාකරණය කිරීම හෝ ව්‍යාපාර අස්තිත්ව පිළියෙළ කිරීම, මිලට ගැනීම හා විකිණීම;

ඉ. (අ) සිට (ඈ) දක්වා ඡේදවලින් අන්‍යාකාරයකින් ආවරණය නොවන්නා වූ, ව්‍යාපාරයක් වශයෙන් තුන්වන පාර්ශවයන්ට පහත දැක්වෙන සේවාවන් එකක් හෝ වැඩි ගණනක් සපයන්නා වූ භාරයක් හෝ සමාගම් සේවා සපයන්නෙක්:

i. නෛතික පුද්ගල සැපයුම හෝ කළමනාකරණය

ii. සමාගමක අධ්‍යක්ෂකවරයෙකු හෝ ලේකම්වරයෙකු, කොටස්කරුවෙකු හෝ හවුල් ව්‍යාපාරයක් වශයෙන් හෝ වෙනත් නෛතික පුද්ගලයින්ට අදාළව සමාන තත්ත්වයකින් ක්‍රියා කිරීම හෝ ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තෙකු වෙනුවෙන් කටයුතු පිළියෙළ කිරීම.

iii. සමාගමක් හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් යම් නෛතික පුද්ගලයෙක් හෝ නියමිත ස්ථානයක් සඳහා ලියාපදිංචි කරන ලද කාර්යාලයක්, ව්‍යාපාරික ලිපිනයක් හෝ ඉඩකඩ තැපැල් මාර්ගික හෝ පරිපාලනමය ලිපිනයක් ලබා දීම.

iv. ප්‍රකාශිත භාරයක භාරකරු වශයෙන් ක්‍රියාකිරීම හෝ ක්‍රියාකිරීම සඳහා වෙනත් තැනැත්තෙකු සූදානම් කිරීම.

v. වෙනත් තැනැත්තෙකු වෙනුවෙන් නාමික කොටස්කරුවෙකු වශයෙන් ක්‍රියාකිරීම හෝ ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තෙකු සූදානම් කිරීම.

5. පනතේ 7 (1) වගන්තියට අනුව,

"ආයතනයකට-

(අ) යම් ගනුදෙනුවක් හෝ ගනුදෙනුවක් කිරීමට තැත්කිරීමක්, යම් නීතිවිරෝධී කටයුත්තක් හෝ වෙනත් යම් සාපරාධී වරදක් කිරීමට අදාළ විය හැකි යැයි සැක කිරීමට තරම් හේතු ඇත්තාවූ; හෝ

(ආ) එයට-

i. 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ විධිවිධාන යටතේ වරදකට සූදානම් වීමේ ක්‍රියාවකට;

සස. නීතිවිරෝධී ක්‍රියාවක් සංස්ථාපනය කෙරෙන ක්‍රියාවක් සම්බන්ධයෙන් තැනැත්තෙකු හෝ තැනැත්තන් පිළිබඳ විමර්ශනය කිරීමකට, නඩු පැවරීමකට නැතහොත්, මේ පනත හෝ 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත හා 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත බලාත්මක කිරීමෙහි ලා අන්‍යාකාරයෙන් සහායවීමකට අදාළ විය හැකියයි සැක කිරීමට තරම් තොරතුරු ඇත්තාවූ අවස්ථාවක, ආයතනය විසින්, හැකි ඉක්මනින් ක්‍රියාවෙහි යෙදිය හැකිතාක් දුරට සැකය ඇතිකර ගැනීමෙන් හෝ තොරතුරු ලැබීමෙන් පසුව, එහෙත්, එතැන් පටන් වැඩ කරන දින දෙකක් පසු නොවී, ගනුදෙනුව හෝ ගනුදෙනු කිරීමට තැත්කිරීම නැතහොත්, තොරතුරු පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තාකරනු ලැබිය යුතුය".

එවැනි වාර්තා මෙහි සැක සහිත ගනුදෙනු වාර්තා ලෙස හැඳින්වේ.

6. ඉහත දක්වා ඇති පරිදි, සියලුම නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සැක සහිත ගනුදෙනු මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීම අවශ්‍ය වේ.

7. පනතේ 7 වන වගන්තිය අනුව වාර්තා කිරීමේ අවශ්‍යතාවය ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් අවශ්‍යවන ක්‍රියා පටිපාටි සහ පද්ධති ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම කල යුතු වේ. තවද, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් සිය නිලධාරීන්, සේවකයින් සහ නියෝජිතයින් සැක සහිත ගනුදෙනු හඳුනා ගැනීම සඳහා පුහුණු කිරීම අවශ්‍ය වේ.

8. 2018 අංක 01 දරන නාමෝද්දිෂ්ට මුල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ) රීතින්හි, රීති අංක 6 (ඊ) සහ 6 (උ) (සසස) අනුව නම් කරන ලද මුල්‍ය නොවන ව්‍යාපාර විසින් මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අභ්‍යන්තර ප්‍රතිපත්තියක් සකස් කර ඒ සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වයේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු අතර එම ප්‍රතිපත්තියට සැක සහිත ගනුදෙනු මුල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීම සඳහා වූ ක්‍රියා පටිපාටි සහ පාලනයන් ඇතුළත් කල යුතුය.

9. පනත යටතේ සෑම නම් කරන ලද මුල්‍ය නොවන ව්‍යාපාරයක්ම තම ගනුදෙනු වලට අදාළ ගනුදෙනු සටහන් හා ලිපිගනුදෙනු වාර්තා සහ මුල්‍ය බුද්ධි ඒකකය වෙත සපයන ලද සියලුම වාර්තා අවස්ථාවෝචිත පරිදි ගිණුම වැසූ හෝ ව්‍යාපාරික සම්බන්ධතාව අවසන් වූ දින පටන් අවුරුදු හයක කාලපරිච්ඡේදයක් සහ ගනුදෙනුවේ ලිපි ගනුදෙනු හෝ වාර්තාව සැක කටයුතු ගනුදෙනු වාර්තා ද ඇතුළුව ඉදිරිපත් කල දින පටන් අවුරුදු 6ක කාලපරිච්ඡේදයක් පවත්වාගත යුතු වේ.

**සැක සහිත ගනුදෙනු වාර්තා කිරීමේ වැදගත්කම**

10. සැක සහිත ගනුදෙනු වාර්තා කිරීම මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම සහ අපරාධවලින් ලැබෙන මුදල් ආශ්‍රිත ගනුදෙනු අනාවරණය කර ගැනීමේ වැදගත් ක්‍රමයකි.

11. සැක සහිත ගනුදෙනු වාර්තා කිරීම ආයතනයක ඵලදායි මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ වැඩසටහනක ප්‍රධාන කාර්යයකි.

12. මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ කාර්යය අර්ථවත් වීමට නම්, එය පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද වෙනත් නීති සහ නියෝග ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමෙහි ප්‍රතිඵලයක් විය යුතුය. මෙම ක්‍රියාවලිය අකාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වීම හේතුවෙන්, නම් කරන ලද මුල්‍ය නොවන ව්‍යාපාර විසින් සාවද්‍ය, අසම්පූර්ණ හෝ නුසුදුසු සැක සහිත ගනුදෙනු වාර්තා ඉදිරිපත් කිරීම හෝ සැක සහිත ගනුදෙනු මුළුමනින්ම වාර්තා කිරීමට අසමත් වීම සිදු විය හැකිය. එවැනි අසමත්වීම් තුලින් නම් කරන ලද මුල්‍ය නොවන ව්‍යාපාර නියාමන, කීර්තිමය, මෙහෙයුම් සහ නීතිමය අවදානම් වලට නිරාවරණය කරනු ලැබේ. සමහර අවස්ථාවල, එවැනි අසමත්වීම් ස්වාභාවික සහ නීත්‍යානුකූල පුද්ගලයින් අපරාධ වගකීම්වලට නිරාවරණය කළ හැකිය.

13. ගනුදෙනුකරුවන්ගේ තොරතුරු ප්‍රභවය සහ ගනුදෙනු පිළිබඳ දැනුම කුමක් වුවත්, මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පද්ධතිය ක්‍රියාත්මක වීම සඳහා ආයතනික කැමැත්තක් තිබිය යුතුය. එනම්, සැක සහිත ගනුදෙනු අනාවරණය කර ගැනීමටත්, ඒවා සද්භාවයෙන් හඳුනා ගැනීමටත්, හඳුනාගත් එවැනි ගනුදෙනු සම්පූර්ණයෙන් සහ නිවැරදිව වාර්තා කිරීමටත් නම් කරන ලද මුල්‍ය නොවන ව්‍යාපාරයෙහි අභිප්‍රායක් තිබිය යුතුය. නම් කරන ලද මුල්‍ය නොවන ව්‍යාපාරයන්හි අධ්‍යක්ෂ මණ්ඩලය / හිමිකරුවන් ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරීන්ගේ පැහැදිලි කැපවීමක් ඇති විට සහ සෙසු කාර්ය මණ්ඩලය ස්ථිර ක්‍රියාමාර්ග සහ ආදර්ශන මගින් දැනුවත් කරන විට, එවැනි ආයතනික කැමැත්තක් පැවතීම සහ ක්‍රියාත්මක කිරීම වඩාත් ඵලදායී වේ. (උදා: ඵලදායී අභ්‍යන්තර ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාවලි සහ පුහුණු වැඩසටහන්, මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ කාර්යයන් විගණනය කිරීම).

14. අසාමාන්‍ය හා සැක සහිත විය හැකි ගනුදෙනු හඳුනා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රධාන සාධකය නම්, ගනුදෙනුකරු සහ ගනුදෙනුකරුගේ ව්‍යාපාරය සහ ඒ හා සම්බන්ධ ගනුදෙනු පිළිබඳ නම් කරන ලද මුල්‍ය නොවන ව්‍යාපාරයන් හි දැනුමයි.

සැකය

15. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් තම ආයතනයට උචිත ලෙස සැකය යන්නට මෙහෙයුම් නිර්වචනයක් සාදා ගත යුතු වේ. ගනුදෙනුකරුගේ චර්යාවක්, තනි ගනුදෙනුවක්, ගනුදෙනු මාලාවක්, තැත් කරන ලද ගනුදෙනුවක් හෝ එහි ඕනෑම සංයෝජනයක් සම්බන්ධ තත්වයන් පිළිබඳ දිගින් දිගටම ඇතිවිය හැකි සැක සහිත ස්වභාවයන් මෙම නිර්වචනයට ඇතුළත් විය හැකිය. එය යම් දෙයක් පවතින තත්වයන් පිළිබඳ පූර්ණ දැනුමක් ලබා දී තිබියදී, අපේක්ෂා කල හෝ පැහැදිලි කර ඇති අයුරින් නොතිබීම පිළිබඳ හැඟීමක් විය හැකිය. සාධක හමුවන්නේ කලාතුරකින් බැවින් සැකය පිළිබඳ හැඟීම සාධක මගින් සැමවිටම සනාථ කරගත නොහැකි වේ. අවශ්‍යයෙන්ම ස්ථිරසාර පදනමක් මත ගොඩනංවනු නොලබන හෝ පරිපූර්ණ වශයෙන් පැහැදිලි යයි කිව නොහැකි විශ්වාසයක් ගොඩ නැංවීමෙහි ලා මෙම නිර්වචනය ඉවහල් විය යුතුය. ඒ අතරම, මෙම විශ්වාසයන් මනංකල්පිත හෝ කෙටි වීමට නිර්වචනය මගින් ඉඩ නොදිය යුතුය. සාමාන්‍යයෙන් පවතින තත්වයකට වඩා වෙනස් සහ පරිපූර්ණව හෝ විශ්වසනීයව පැහැදිලි කර නොමැති සැක කටයුතු චර්යාවන් සහ ක්‍රියාකාරකම් නිසැකවම නිර්වචනය සැකසීමේදී සැලකිය යුතුය.

සැකය සඳහා මෙහෙයුම් නිර්වචනය, සාධාරණත්වය තහවුරු කරන්නක් විය යුතුය. නිර්වචනය ඉතා පටු හෝ අනම්‍ය නම්, එමගින් අපේක්ෂා නොකළ නීතිවිරෝධී තත්වයන් වන ගනුදෙනු බැහැර විය හැකි අතර අපරාධකරුවන්ද නිර්වචනය මගින් මගහැරී යා හැකිය. අනෙක් අතට, ඕනෑවට වඩා පුළුල් හෝ නම්‍යශීලී නිර්වචනයක් මඟින් නීතිවිරෝධී වියහැකි තත්වයන් පිළිබිඹු නොකරන සැක සහිත ගනුදෙනු වාර්තා විශාල සංඛ්‍යාවක් ඇති විය හැකිය. සැක සහිත දර්ශක සහ නිදර්ශන සැක සහිත ගනුදෙනු හඳුනා ගැනීමේ ප්‍රධාන අංගයක් විය හැකි අතර එවැනි සැකයන් හඳුනා ගැනීමේදී "අසාමාන්‍ය" චර්යා හා ගනුදෙනු රටාවන් ද සලකා බැලිය යුතුය.

ගනුදෙනු සහ චර්යා සඳහා සැක සහිත දර්ශක ඇතුළත් නිරවශේෂයෙන්ම සවිස්තරාත්මක නොවන සහ නිල නොවන ලැයිස්තුවක් ෂ වන උපග්‍රන්ථයෙහි දක්වා ඇත. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර තම ව්‍යාපාරයේ ස්වභාවය සහ ප්‍රමාණය මත පදනම්ව තමන්ගේම දර්ශක හඳුනාගැනීම සහ සකස්කිරීම කල යුතුවේ. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් මෙම දර්ශක භාවිතා කරන විට, ඒවා නියතයන් නොවන බවත්, සාපරාධී ක්‍රියාකාරකම් අවශ්‍යයෙන්ම නිරූපණය නොවන බවත් සැලකිල්ලට ගත යුතුය. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයන් හි සැක සහිත ගනුදෙනු හඳුනා ගැනීම දර්ශකවල දක්වා ඇති තත්වයන්ට පමණක් සීමා නොවිය යුතු අතර අවසානයේ එය ගනුදෙනුකරුගේ දැනුම, ව්‍යාපාරය සහ අදාළ ගනුදෙනු මත පදනම් විය යුතුය.

16. පනත සහ ඒ යටතේ නිකුත් කර ඇති අනෙකුත් රීති, නියෝග, චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමෙන් පසුව සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර වෙත ළඟා විය හැකි කරුණු හා තත්වයන් සලකා බැලීමෙන් පසුව සහ එවැනි කරුණු යහපත් විශ්වාසයකින් හා නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර අවබෝධ කර ගැනීමේ පරිචය තුළ හඳුනාගෙන තිබේ නම්, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සඳහා සැක සහ අවදානම්, "සැක සහිත" යැයි සැලකෙන ගනුදෙනු, ගනුදෙනුවේ ප්‍රමාණය නොසලකා මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ යුතුය.

17. මූල්‍ය බුද්ධි ඒකකය වෙත සැක සහිත ගනුදෙනු වාර්තා ඉදිරිපත් කිරීමට පෙර නීතිවිරෝධී ක්‍රියාකාරකම් ස්ථාපිත කිරීම නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර වෙතින් අපේක්ෂා නොකෙරේ. ඒ වෙනුවට ඔවුන් ගනුදෙනුවක් හෝ ගනුදෙනු හෝ සැකයක් ඇතිවීමට හේතු වන හැසිරීම් සමූහයක් වටා ඇති අසාමාන්‍ය තත්වයන් වාර්තා කළ හැකිය.

සැක සහිත ගනුදෙනු වාර්තා කිරීම

18. අනුකූලතා නිලධාරියා විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද සහ අත්සන් කරන ලද සැක සහිත ගනුදෙනු වාර්තා 2017 සැක සහිත ගනුදෙනු (ආකෘති) නියෝගයන්හි 5 වන උපලේඛනය භාවිතා කරමින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත ඉදිරිපත් කළ යුතුය (උපග්‍රන්ථය ෂ).

19. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් සැක සහිත ගනුදෙනු වාර්තා නියමිත ආකෘතියෙන් ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර ඒවා තැපැල්, ෆැක්ස් හෝ විද්‍යුත් තැපෑලෙන් හෝ මූල්‍ය බුද්ධි ඒකකය විසින් තීරණය කරනු ලබන වෙනත් ආකාරයකින් ලබා දිය යුතුය.

20. සැකය දුරකථනයෙන් දැනුම් දිය හැකිය; කෙසේ වෙතත් එය නියමිත ආකෘතියෙන් පැය විසිහතරක් ඇතුළත ලිඛිතව එවිය යුතුය.

වාර්තා කිරීමේ වේලාව

21. පනතේ 7 (1) වගන්තිය මඟින් ප්‍රායෝගිකව හැකි ඉක්මනින් සැක සහිත ගනුදෙනු වාර්තා මූල්‍ය බුද්ධි ඒකකය වෙත ඉදිරිපත් කළ යුතු නමුත් සැකයක් ඇති වී වැඩ කරන දින දෙකක් ඇතුලත එවිය යුතුය. මෙයින් අදහස් කරන්නේ, මූල්‍ය නොවන ව්‍යාපාරයන් හි ක්‍රියාදාමයන්, ක්‍රියා පටිපාටි සහ පියවර නොසලකා, අදාල ක්‍රියාවලි සම්පූර්ණ කර නොමැති වුවද සැකයේ ආරම්භක අවස්ථාවේදීම වාර්තා කළ යුතු බවයි. සැකයක් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මූල්‍ය නොවන ව්‍යාපාරයන් හි ක්‍රියාවලිය සැක සහිත ගනුදෙනු වාර්තා ගොනු කිරීම සමඟ සමගාමීව ඉදිරියට යා හැකිය. ගනුදෙනුකරු සමඟ ව්‍යාපාරික සම්බන්ධතාවය සඳහා සහ ව්‍යාපාරික සම්බන්ධතාවයේ ඕනෑම අවස්ථාවක ඕනෑම වේලාවක සැකය ඇතිවිය හැකි බව සැලකිල්ලට ගත යුතුය - නිදසුනක් ලෙස - ව්‍යාපාරික සම්බන්ධතාවය ස්ථාපිත කිරීමේදී, අනන්‍යතාවය තහවුරු කර ගැනීමේදී, ගනුදෙනුකරුවන්ගේ ගිණුම් සහ ගනුදෙනු අධීක්ෂණය කරන විට සැකයක් ඇතිවිය හැකිය.

නිදසුනක් වශයෙන්, ගනුදෙනුකරුවෙකු නිවාස මිලදී ගැනීම සඳහා දේපල වෙළඳාම් නියෝජිතයෙකු වෙත පැමිණේ. දේපල සම්බන්ධ කිසිදු ලේඛනයක තම නම සඳහන් වීමට තමා කැමති නැති බව ඔහු දිගින් දිගටම අවධාරණය කරන අතර ඒ වෙනුවට සියලු ලියකියවිලි හා සම්බන්ධ නොවන තෙවන පාර්ශවයක නමක් ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටියි. මෙය ගනුදෙනුකරු පිළිබඳ ක්ෂණික සැකයක් ඇති කළ අතර ප්‍රායෝගිකව හැකි ඉක්මනින් නමුත් ගනුදෙනුව සිදු වී වැඩකරන දින දෙකක් ඇතුළත මෙම සැකය මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ යුතු අතර ගෙවීම්වල සත්‍යතාව සහ තොරතුරු සත්‍යාපනය කිරීම සඳහා නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සිය අභ්‍යන්තර ක්‍රියාවලීන් සමඟ ඉදිරියට යා හැකිය.

22. සැක සහිත ගනුදෙනු වාර්තා යැවීමෙන් පසු, මූලික සැකයට සහය දැක්වීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට අමතර කරුණු හෝ තත්වයන් සොයා ගන්නේ නම්, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර එවැනි අතිරේක තොරතුරු මූල්‍ය බුද්ධි ඒකකය වෙත නිසි පරිදි ලබා දිය යුතුය.

වාර්තා කිරීමේ අන්තර්ගතය

23. සම්පූර්ණත්වය: එක් සැක සහිත ගනුදෙනුවක් සඳහා එක් සැක සහිත ගනුදෙනු වාර්තාවක් එවිය යුතු අතර සැකය පිළිබඳ සම්පූර්ණ තොරතුරු අඩංගු විය යුතුය. සැක සහිත ගනුදෙනු වාර්තා මගින් සැකය පිළිබඳ සම්පූර්ණ චිත්‍රයක් මෙන්ම එම සැකයට තුඩු දුන් සහ සහාය දුන් අවස්ථා පිළිබඳ සම්පූර්ණ චිත්‍රයක් සැපයිය යුතුය. විවිධ ගනුදෙනු සහ / හෝ හැසිරීම් යම් සැකයක් සමඟ සම්බන්ධ වී ඇති විට මේ සියල්ල අල්ලා ගනිමින් තනි සැක සහිත ගනුදෙනු වාර්තාවක් ගොනු කළ යුතුය.

24. ආකෘති විස්තරය: සැක සහිත ගනුදෙනු වාර්තා හි විස්තරාත්මක කොටස වඩාත් වැදගත් වේ. සැක සහිත ගනුදෙනු වාර්තා ඉදිරිපත් කරන විට, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් 2017 සැක සහිත ගනුදෙනු (ආකෘති) නියෝගයන්හි ඩ වන උපලේඛනයේ සම්පූර්ණ සවිස්තරාත්මක ආඛ්‍යානයක් ලබා දිය හැකිය. ආඛ්‍යානය උත්සාහ කළ යුත්තේ කුමක්, කවුද, කවදාද, කොතැනද, ඇයි සහ කෙසේද යන්න පිළිබඳ මූලික විස්තරාත්මක ප්‍රශ්නවලට හැකි තරම් දුරට පිළිතුරු සැපයීමටය.

නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හැකි තරම් පැහැදිලි ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත සැපයිය යුතුය;

- සම්බන්ධ වී ඇති මුදල් ප්‍රමාණය
- අදාළ ගනුදෙනුව සිදු කළ ස්ථානය
- ගනුදෙනුව/ගනුදෙනු සිදු කල දිනය

පහත දැක්වෙනුයේ, ආඛ්‍යානය විසින් පිළිතුරු ලබාදීමට උත්සහ ගත යුතු ප්‍රශ්න සමහරක් වේ; ප්‍රශ්න කලයුතු පොදු ලක්ෂණ කීපයක් නම්;

- සැකයෙහි ස්වභාවය කුමක්ද?
- සිදු වීමට ඉඩ ඇති වැරදි තිබේද?
- සැකයට අදාළ හා සම්බන්ධ වන ගනුදෙනු, උත්සාහ කළ ගනුදෙනු, හැසිරීම්, කරුණු, විශ්වාසයන් සහ තත්වයන් මොනවාද?
- ගනුදෙනුව හා සම්බන්ධ වී ඇති ස්වාභාවික හා නීතිමය පුද්ගලයින් කවුද?
- ප්‍රතිලාභී හිමිකරුවන් කවුරුන්ද (අදාළ නම්)?
- නම්, හැඳුනුම්පත් අංක, ලියාපදිංචි අංක ආදී වූ හඳුනාගැනීමේ තොරතුරු මොනවාද?
- ලිපිනය / සම්බන්ධිත ස්ථාන මොනවාද?
- ඔවුන්ගේ වෘත්තීන් හෝ ව්‍යාපාර වර්ග මොනවාද?
- ඔවුන්ගේ සේවායෝජකයන් කවුද?
- ඔවුන් සතුව දේශපාලන අනාවරණය වීම් ඇත්නම් ඒ මොනවාද?
- ඔවුන් එකිනෙකා සමඟ හා ගනුදෙනු සමඟ සම්බන්ධ වන්නේ කෙසේද?
- ගනුදෙනු වලදී ඔවුන්ගේ කාර්යභාරය කුමක්ද?
- ගනුදෙනු හෝ ගනුදෙනු කිරීමට තැත් කිරීමක් හෝ හැසිරීම් සිදු වූයේ කවදාද සහ කොතැනකද?
- ගනුදෙනු සිදු වූ වේලාව හෝ ස්ථානය සැකයට හේතු වන්නේ කෙසේද?
- මෙම කරුණු සහ තත්වයන් සැකයට සහය වන්නේ ඇයි?
- සැකය ඇති වූයේ කෙසේද?
- නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග තිබේ නම්.
- නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් දැනටමත් ඉදිරිපත් කර ඇති අදාළ සැක සහිත ගනුදෙනු වාර්තා තිබේද?

ආඛ්‍යානය තර්කානුකූල ආකාරයකින් ව්‍යුහගත කළ යුතු අතර එමගින් තොරතුරු හැකිතාක් කාර්යක්ෂමව, සම්පූර්ණව හා නිරවද්‍යව මූල්‍ය බුද්ධි ඒකකය වෙත ලබාදිය හැකිය. සැක සහිත ගනුදෙනු වාර්තා ආඛ්‍යානයන් සඳහා හැඳින්වීමක්, අන්තර්ගතයක් සහ නිගමනයක් යනාදියෙන් සමන්විත රචනා ආකෘතින් භාවිතා කළ හැකිය. ආඛ්‍යානය තාර්කික ඒකකයන්ට බෙදීමට සහ කියවීමේ හැකියාව වැඩි කරලීමට ඡේද ඛණ්ඩනයන් භාවිතා කළ හැකිය.

25. නිරවද්‍යතාවය: සැක සහිත ගනුදෙනු වාර්තා මඟින් සපයා ඇති තොරතුරු නිරවද්‍යවීම අත්‍යවශ්‍ය වේ. එනම් නම්, හැඳුනුම්පත් අංක, ලියාපදිංචි අංක යනාදිය. හඳුනාගැනීමේ ලේඛන වල සියලුම අක්ෂර වින්‍යාස සහ පිටපත් දෙවරක් පරීක්ෂා කළ යුතු වේ. විදේශ ගමන් බලපත්‍ර අංකයක හෝ ජාතික හැඳුනුම්පතක එක් ඉලක්කමක් සාවද්‍ය වීමෙන් හෝ නමක අක්ෂර මාරු වීමෙන් හෝ අස්ථානගත වීමෙන් මූල්‍ය බුද්ධි ඒකකය විසින් සිදුකරනු ලබන විශ්ලේෂණ සාර්ථක හෝ අසාර්ථක වීම කෙරෙහි බලපෑම් ඇති කල හැකිය. නෛතික ආයතන සඳහා හඳුනාගැනීම් (උදා: සමාගම් / ව්‍යාපාර ලියාපදිංචි අංකය, සමාගමේ ලියාපදිංචි නම) ඕනෑම නිල ලියාපදිංචි ලේඛනයක ඇති ඒවා සමඟ සෑම ආකාරයකින්ම නියත වශයෙන්ම සමාන විය යුතුය.

උපකාරක ලේඛන ඉදිරිපත් කිරීම

26. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් සැක සහිත ගනුදෙනු වාර්තා සමග අදාළ උපකාරක ලේඛන ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

27. උපකාරක ලේඛන මගින් සැක සහිත ගනුදෙනු වාර්තා හි අන්තර්ගතයට වඩා වැඩිදුර යමක් එක් කල යුතු වේ. උපකාරක ලේඛනයේ තොරතුරු සෘජුවම ආඛ්‍යාන ලේඛනයට ඇතුලත් කල හැකි විට වෙනමම උපකාරක ලේඛනයක් එවීම අවශ්‍ය නොවේ. නිදසුනක් වශයෙන්, සැකයට දේපළ වෙළඳාම් මිලදී ගැනීමක් සම්බන්ධ නම්, සැකයට අදාළ මිලදී ගැනීම් සම්බන්ධ සියලු විස්තර ආඛ්‍යානයට ඇතුළත් කළ යුතුය.

28. ආධාරක ලේඛනවල පෙන්නුම්කල හැකි නමුත් පරිපූර්ණ නොවන අවස්ථා ලැයිස්තුවක් සහ ඊට අනුරූප අවස්ථා පහත දැක්වේ.

| අවස්ථාව | උපකාරක ලේඛනවල දර්ශක ලැයිස්තුව |
|---|---|
| ව්‍යාජ / වෙනස් කළ අනන්‍යතාවය පිළිබඳ සැකය (ජාතික හැඳුනුම්පත / විදේශ ගමන් බලපත්‍රය / රියදුරු බලපත්‍රය) | ■ ලේඛනවල පිටපත |
| දේපල ගනුදෙනුවක හිමිකරුගේ අරමුදල් ප්‍රභවය සහ දේපල අතර විෂමතාවය | ■ විකුණුම් සහ මිලදී ගැනීමේ ගිවිසුම<br>■ දේපල ගනුදෙනුවට අදාළ කුවිතාන්සි |
| ගනුදෙනුකරුගේ වෘත්තීය විස්තර සමග මැණිකේ ගනුදෙනු වටිනාකමට නොගැලපේ | ■ මැණික් අලෙවිය හා සම්බන්ධ කුවිතාන්සි |
| ගනුදෙනුකරුවන් නිතිපතා කැසිනෝ වටිනාකම් උපකරණ මිලදී ගැනීම සහ නිරන්තරයෙන්ම අවම ගනුදෙනු සීමාවට අසන්න එහෙත් එය ඉක්මවා නොයන ගනුදෙනු පවත්වාගැනීම | ■ කැසිනෝ ගනුදෙනුවට සම්බන්ධ කුවිතාන්සි |
| නීතිඥයකුගේ පාරිභෝගිකයා භෞතිකව හමුවීමකින් හෝ ඇටෝර්නි බලපත්‍රයක් රහිතව තෙවන පාර්ශවයකට ඔප්පුවක් මාරු කරයි | ■ හුවමාරු ඔප්පු<br>■ ගෙවීම් කුවිතාන්සි |
| ගණකාධිකාරීවරයෙකුගේ පාරිභෝගිකයෙක් ඔවුන්ගේ ඉන්වොයිස් වටිනාකමට වඩා වැඩියෙන් ගෙවා ඇත | ■ ගිණුම් ප්‍රකාශන<br>■ වැඩිපුර ගෙවන ලද ඉන්වොයිසි |

## විවිධ

### රහස්‍යභාවය

29. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් සැක සහිත ගනුදෙනු වාර්තාවක් ගොනු කර ඇත්නම් හෝ ගොනු කිරීමට අදහස් කරගෙන සිටී නම් පනතෙහි 9 වන වගන්තියට අනුව, එහි අන්තර්ගතය පිළිබඳව පාරිභෝගිකයා ද ඇතුළුව කිසිදු පුද්ගලයෙකුට දැනුම් දීම නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සඳහා තහනම් කර ඇත.

30. ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතිවලට අනුව, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් ගනුදෙනුකරුවකුට අදාළව මුදල් විශුද්ධිකරණය හෝ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම පිළිබඳ සැකයක් ඇති වූ අවස්ථාවක ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ ක්‍රියාවලිය පාරිභෝගිකයාට සැකයක් ඇති කිරීමට ඉවහල් වනු ඇතැයි සාධාරණ ලෙස විශ්වාස කරයි නම්, ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ පියවර නොගෙන නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර වලට ඉදිරියට යා හැකිය. කෙසේ වෙතත්, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් පනතේ 7 වන වගන්තියට අනුකූලව වහාම සැක සහිත ගනුදෙනු වාර්තාවක් ගොනු කිරීම අවශ්‍ය වේ.

**රහස්‍යභාවය උල්ලංඝණය කිරීම**

31. නම් කරන ලද මුල්‍ය නොවන ව්‍යාපාරයන්හි ඕනෑම නිලධාරියෙකු විසින් සැක සහිත ගනුදෙනු වාර්තා කිරීම පිළිබඳව කිසියම් ගනුදෙනුකරුවකුට තොරතුරු ලබා දෙන්නේ නම්, එය පනතේ 9 සහ 10 වගන්ති යටතේ පනතෙහි නීති උල්ලංඝණය කිරීමක් ලෙස සලකනු ලැබේ. මෙය ගනුදෙනුකරු වෙත හෝඩුවාවක් ලැබෙන පරිදි හැසිරීම පිළිබඳ වරදක් ලෙස විස්තර කෙරෙන අතර එය රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයක් හෝ වසර දෙකකට නොවැඩි කාලයක් සඳහා සිර දඬුවමක් හෝ දෙකම හෝ යනාදී වශයෙන් දඬුවම් ලැබිය හැකි වරදකි.

**සැක සහිත ගනුදෙනු වාර්තා කරන පුද්ගලයින් සඳහා ආරක්ෂාව**

32. පනතේ 12 වන වගන්තියට අනුව, සද්භාවයෙන් හෝ පනත යටතේ මුල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරන ලද රීති හෝ විධාන වලට අනුකූලව, ආයතනය විසින් විගණක ව්‍යාපාරික ආයතනය හෝ අධීක්ෂණ අධිකාරිය, හෝ ඒ ආයතනයේ අධ්‍යක්ෂකවරයකු, කොටස්කරුවකු, නිලධාරියකු, සේවා නියුක්තිකයකු හෝ අනුයෝජිතයකු විසින් කරන ලද යම් ක්‍රියාවකට අදාළව,

(අ) ඒ ආයතනයට, ආයතනයක විගණකවරයකු හෝ අධීක්ෂකවරයකු අධිකාරියට විරුද්ධව; නැතහොත්

(ආ) ආයතනයක, විගණක ව්‍යාපාරික ආයතනයක හෝ අධීක්ෂණ අධිකාරියක ඒ තැනැත්තකුගේ සේවා නියුක්තියෙහි යෙදී ක්‍රියා කරන අතරතුර අධ්‍යක්ෂවරයකුට, කොටස්කරුවකුට, නිලධාරියකුට, සේවානියුක්තයකුට හෝ අනුයෝජිතයකුට විරුද්ධව

සිවිල්, අපරාධ හෝ විනයානුකූල නීති කෘත්‍ය කිසිවක් නොගත යුතු ය.

33. පනතේ 7 සහ 10 වගන්තිවලට අනුකූලව, නම් කරන ලද මුල්‍ය නොවන ව්‍යාපාරයන් හි ඕනෑම නිලධාරියකුගේ හෝ සේවකයකුගේ අනන්‍යතාවය ද ඇතුළුව සැක සහිත ගනුදෙනු වාර්තාවක අන්තර්ගත සියලුම තොරතුරු හෝ එම වාර්තාව සඳහා සහය දක්වන අතිරේක තොරතුරු, මුල්‍ය බුද්ධි ඒකකය විසින් දැඩි රහස්‍යභාවයකින් යුතුව සලකනු ලැබේ.

**සැක සහිත ගනුදෙනු වාර්තා කිරීමට අපොහොසත් වීම**

34. ගනුදෙනුවක් මුදල් විශුද්ධිකරණයට හෝ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමට සම්බන්ධ බවට සැක කිරීමට සාධාරණ හේතු පවතින විට, නම් කරන ලද මුල්‍ය නොවන ව්‍යාපාර විසින් සැක සහිත ගනුදෙනු වාර්තා කිරීමට අපොහොසත් වීම පනත යටතේ අනුකූල නොවීමේ වරදක් ලෙස සලකනු ලැබේ. පනතෙහි 19 වන වගන්තියට අනුව, පනතෙහි 7 වන වගන්තියට අනුකූල වීමට අපොහොසත් වන්නන් අදාළ අනුකූල නොවීමේ ස්වභාවය සහ බැරෑරුම්කම සැලකිල්ලට ගනිමින් දණ්ඩනයකට යටත් වේ. කෙසේ වෙතත් එවැනි දණ්ඩනයක් ඕනෑම අවස්ථාවක රුපියල් මිලියන එකකට වඩා වැඩි නොවිය යුතුය. පෙර අවස්ථාවකදී දණ්ඩනයකට යටත් වූ පුද්ගලයෙකු, පසුව වෙනත් අවස්ථාවක අනුකූල වීමට අපොහොසත් වන සෑම වාරයකදීම, දණ්ඩනයක් ලෙස පෙර පනවා තිබූ මුදල මෙන් දෙගුණයක අතිරේක දඩ මුදලක් ගෙවීමට එම තැනැත්තා බැඳී සිටී.

35. තවද, පනතෙ හි 28 වන වගන්තිය ප්‍රකාරව, පනතේ 7 වන වගන්තිය යටතේ වාර්තාවක් ඉදිරිපත් කිරීමේදී, යම් විශේෂ කරුණක දී වැරදි යැයි හෝ නොමග යවන සුළු යැයි තමා දන්නා යම් ප්‍රකාශයක් කරන, නැතහොත්, ප්‍රකාශය වැරදි බව දැනගෙන යම් ප්‍රකාශයකින් යම් කාරණයක් හෝ දෙයක් ඉවත් කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ එකකට නොවැඩි දඩයකින් හෝ අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට, හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකෙන්ම හෝ දඬුවම් කරනු ලැබිය හැකිය.

සැක සහිත ගනුදෙනු වාර්තාවක් හා සම්බන්ධිත ගනුදෙනුකරුවකු සමග වාර්තා කරනු ලබන ආයතනයක් විසින් ව්‍යාපාරික සම්බන්ධතාවය දිගටම පවත්වා ගත යුතුද?

36. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් ඉදිරිපත් කරන ලද සැක සහිත ගනුදෙනු වාර්තාවක් හා සම්බන්ධිත හෝ සාධාරණ සැකයක් ඇති ගනුදෙනුකරුවකු සමග අඛණ්ඩව ව්‍යාපාරික සබඳතා පැවැත්වීම පනත මගින් තහනම් නොකරයි. විශේෂයෙන්ම, පනතේ 3 වන වගන්තියේ ප්‍රතිපාදන යටතේ එම ගනුදෙනුකරු සම්බන්ධයෙන් නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරය ගනුදෙනුකරු වෙත හෝඩුවාවක් ලැබෙන පරිදි කටයුතු නොකළ යුතුය.

**සැක සහිත ගනුදෙනු වාර්තා හා සම්බන්ධිත ගනුදෙනුකරුවන් සමග අඛණ්ඩව ව්‍යාපාරික සම්බන්ධතාව පවත්වාගෙන යාමේදී නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර වෙත ඇති වගකීම්**

37. සැක සහිත ගනුදෙනු වාර්තාවක් ඉදිරිපත් කරන ලද මූලික අවස්ථාවෙන් පසුව, අදාළ ගනුදෙනුකරු සමග සිදු කරනු ලබන ඉදිරි ගනුදෙනුවලදී නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරය විසින් අතිරේක සැක සහිත ගනුදෙනු වාර්තා / තවදුරටත් හඳුනාගත් / වර්ධනය වූ සැකයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම ද ඇතුළුව පනතෙහි අදාළ වන සියලුම ප්‍රතිපාදන සමග අනුකූල විය යුතුය.

**වැඩිදුර තොරතුරු ඉල්ලීම්**

38. පනතෙ හි 7 (3) වගන්තියට අනුව, ඕනෑම සැක සහිත ගනුදෙනු වාර්තාවක් සම්බන්ධව මූල්‍ය බුද්ධි ඒකකය විසින් වැඩිදුර තොරතුරු ඉල්ලා ඇති අවස්ථාවකදී, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරය විසින් එවැනි තොරතුරු වහාම මූල්‍ය බුද්ධි ඒකකය වෙත ලබා දීමට අවශ්‍ය සියලු පියවර ගත යුතුය.

39. ඊට අමතරව, පනතෙහි 15 (1) (ආ) වගන්තියේ දක්වා ඇති පරිදි, නීතිවිරෝධී ක්‍රියාවක්, හෝ මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට හෝ ත්‍රස්තවාදී කටයුත්තක් වෙනුවෙන් මුදල් සැපයීම පිළිබඳ වරදක් සංස්ථාපනය කෙරෙන ක්‍රියාවකට අදාළව මූල්‍ය බුද්ධි ඒකකය විසින් වැඩිදුර තොරතුරු ඉල්ලා ඇති අවස්ථාවකදී, රජය විසින් නඩත්තු කරනු ලබන දත්ත ආධාරක වල ගබඩා කර ඇති තොරතුරු ද ඇතුළත් එකතු කර ගත්තා වූ හෝ පවත්වාගෙන යන ලද්දා වූ, වාණිජමය වශයෙන් ඇති දත්ත ආධාරක හෝ තොරතුරු ද ඇතුළුව ප්‍රසිද්ධියේ පවත්නා හෝ එසේ නොමැති තොරතුරු, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් ලබා දිය යුතු වේ.

## උපග්‍රන්ථය I - සැක සහිත දර්ශක

මෙම උපග්‍රන්ථයේ ගනුදෙනුකරුවන්ගේ සැක සහිත හැසිරීම් සහ ක්‍රියාකාරකම් සම්බන්ධ දර්ශක ලැයිස්තුවක් අඩංගු වේ. මෙම ලැයිස්තුව නිරවශේෂයෙන්ම සවිස්තරාත්මක හා පරිපූර්ණ නොවන අතර ඒවා එක් එක් නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් අවශ්‍ය පරිදි වෙනස් කර ගත යුතුය. මෙම දර්ශකයන් නියතයක් නොවන අතර සැමවිටම ඒවාහි සාපරාධී බවක් නොපෙන්වයි. අනෙක් අතට, එවන් දර්ශකයන් නොමැතිවීම මගින් සාපරාධීත්වයක් පෙන්නුම් නොකරන බවක්ද නොහැඟවෙයි. **කෙසේ වෙතත්, එලෙස එක් දර්ශකයක් හෝ දර්ශක කිහිපයක් පැවතීම, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් වැඩි පරීක්ෂාවකින් කටයුතු කල යුතු අවස්ථාවක් වන අතර එවැනි පරීක්ෂාවන් සැකයක් ඇති කරලීමට හේතු විය හැක.**

### සාමාන්‍ය දර්ශක

- අවස්ථානුකූලව අසාමාන්‍ය වන ඕනෑම චර්යාවක්
- ගනුදෙනුකරුවකු හා සම්බන්ධ ඕනෑම අසාමාන්‍ය ක්‍රියාකාරකමක්
- ඕනෑම අසාමාන්‍ය ක්‍රියාකාරකමක්
- නීතිවිරෝධී ක්‍රියාකාරකමක් සම්බන්ධ යැයි විශ්වාස කිරීමට නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර වෙත ඇති ඕනෑම තොරතුරක්.
- ගනුදෙනුකරුවන් හා ඔවුන්ගේ ගනුදෙනු හෝ ගනුදෙනු කිරීමට තැත් කිරීමක් සම්බන්ධව නොවිසඳුණු සහ කල්පවත්නා සැකයන්

### සාමාන්‍ය චර්යාත්මක හෝ ගනුදෙනුකරුවන් සම්බන්ධ දර්ශක

- හාස්‍යජනක ආකාරයකින් වුවද, අපරාධ ක්‍රියාවලට සම්බන්ධ වීම පිළිබඳව ගනුදෙනුකරු සාකච්ඡ කිරීම හෝ ඉඟි කිරීම.
- නිවසේ ලිපිනයට යවන කිසිදු ලිපි හුවමාරුවක් ගනුදෙනුකරුට අවශ්‍ය නොවීම.
- ගනුදෙනුකරු නැවත නැවතත් එක් ලිපිනයක් භාවිතා කරන නමුත් නිතර සම්බන්ධ වන නම් වෙනස් කිරීම.
- ගනුදෙනුකරු විසින් එකිනෙකට ආසන්නත ලිපිනයන් කිහිපයක් භාවිතා කිරීම.
- පරිශ්‍රයට පැමිණෙන විට ගනුදෙනුකරු සමඟ පැමිණ බලා සිටීම.
- ගනුදෙනුකරු අභ්‍යන්තර පද්ධති, පාලනයන් සහ ප්‍රතිපත්ති පිළිබඳ අසාමාන්‍ය කුතුහලයක් පෙන්වීම.
- ගනුදෙනුකරු විසින් ගනුදෙනුව පිළිබඳ ව්‍යාකූල හෝ නොගැලපෙන තොරතුරු ඉදිරිපත් කිරීම.
- ගනුදෙනුකරු ගනුදෙනුව පමණට වඩා සාධාරණීකරණය කිරීම හෝ පැහැදිලි කිරීම.
- වාර්තාකරණ දත්ත වෙනස් කිරීම හෝ මඟ හැරීම සඳහා ගනුදෙනුකරු විසින් කාර්ය මණ්ඩලය ඒත්තු ගැන්වීමට උත්සාහ කිරීම.
- ගනුදෙනුකරු රහසිගත ලෙස කටයුතු කිරීම සහ පෞද්ගලිකව හමුවීමට අකමැති වීම.
- ගනුදෙනුව සිදු කරන අවස්ථාවේදී ගනුදෙනුකරුගේ නොසන්සුන් බවක් පෙන්නුම් කිරීම.
- ගනුදෙනුව ඉක්මනින් සිදු කිරීමට ගනුදෙනුකරු විසින් බල කිරීම.
- ගනුදෙනුකරු කාර්ය මණ්ඩලය සමඟ සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට උත්සාහ කිරීම.
- ගනුදෙනුකරු ගනුදෙනුව සිදුකිරීම හෝ සේවා සැපයීම සඳහා මුදල්, විශාල කොමිස් මුදල් හෝ අසාමාන්‍ය අනුග්‍රහයන් ලබාදීම.
- සැක සහිත ගනුදෙනු වාර්තාකරණයට අදාළ වන නීතිය සම්බන්ධයෙන් ගනුදෙනුකරුට අසාමාන්‍ය දැනුමක් පැවතීම.

- මුදල් විශුද්ධිකරණයේ නිරතවීම හෝ නිරතවීමට අවශ්‍ය නොවීම පිළිබඳ ගනුදෙනුකරු විහිළු කිරීම.

**අනන්‍යතා දර්ශක**

- ගනුදෙනුකරු විසින් සැක උපදවන හෝ නොපැහැදිලි තොරතුරු සැපයීම.
- ගනුදෙනුකරු විසින් ව්‍යාජ ලෙස, වෙනස් කරන ලද ලෙස හෝ සාවද්‍ය ලෙස පිළිබිඹු වන අනන්‍යතාවයන් හෝ අසත්‍ය අනන්‍යතාවයන් ඉදිරිපත් කිරීම.
- පුද්ගලික හඳුනාගැනීමේ ලේඛන ඉදිරිපත් කිරීම ගනුදෙනුකරු විසින් ප්‍රතික්ෂේප කිරීම.
- ගනුදෙනුකරු සතුව මුල් හඳුනාගැනීමේ ලේඛන නොමැති අතර එවැනි ලේඛනවල පිටපත් පමණක් තිබීම.
- ගනුදෙනුකරු ඉදිරිපත් කරනු ලබන සහාය ලේඛනයන්හි වැදගත් තොරතුරු නොපැවතීම.
- අනන්‍යතා ලේඛන හෝ ගනුදෙනුකරු හඳුනාගැනීමට අදාල අනිකුත් ලේඛන ඉදිරිපත් කිරීම ගනුදෙනුකරු විසින් අනවශ්‍ය ලෙස ප්‍රමාද කිරීම.
- විදේශීය ගනුදෙනුකරුවෙකු විසින් ඔහුගේ / ඇයගේ ජාතිකත්වය පිළිබිඹු නොකරන සහ තහවුරු කරගැනීමට අපහසු හඳුනාගැනීමේ ලේඛන ඉදිරිපත් කිරීම.
- ගනුදෙනුකරු විසින් අළුත් ලෙස පිළිබිඹු වන හෝ මෑතකාලීන නිකුත් කළ දිනයන් සහිත හඳුනාගැනීමේ ලේඛන ඉදිරිපත් කිරීම.
- ගනුදෙනුකරු රැකියා විරහිත වීම, හෝ නිරන්තරව රැකියා මාරු කරලීම.
- ගනුදෙනුව සිදු කිරීම සඳහා ගනුදෙනුකරු විශාල මුදල් ප්‍රමාණයක් ප්‍රදර්ශනය කරලීම.

**ව්‍යාපාරයක් සඳහා දර්ශක**

- ව්‍යාපාරයට අක්‍රමවත් ව්‍යාපාරික වේලාවන් පැවතීම.
- ව්‍යාපාරය අසාමාන්‍ය ලෙස ලාභදායී ව්‍යාපාරයක් වීම.
- ව්‍යාපාරය අසාර්ථක කර්මාන්තයක ලාභදායී ලෙස පවත්වාගෙන යන ව්‍යාපාරයක් වීම.
- ව්‍යාපාර ලැබීම් සහ ආදායම් අදාළ කර්මාන්තයේ සම්මතයන්ට වඩා බෙහෙවින් වැඩි වීම.
- අඩු පිරිවැය සහිත හෝ වඩා පහසු ක්‍රමවේදයන් ඇති විටක, අධික පිරිවැය සහිත හෝ අපහසු ක්‍රමවේදයන් භාවිතා කිරීම.
- තමාගේම ව්‍යාපාරය හෝ කර්මාන්තය පිළිබඳ ගැඹුරු දැනුමක් නොමැති බව දිස්වීම.

ගනුදෙනු සම්බන්ධ සාමාන්‍ය දර්ශක

- ගනුදෙනුකරුවා සමඟ සැසඳීමේදී අසාමාන්‍ය ගනුදෙනු.
- රට සමඟ සැසඳීමේදී අසාමාන්‍ය ගනුදෙනු.
- කර්මාන්තය සමඟ සැසඳීමේදී අසාමාන්‍ය ගනුදෙනු.
- වෙනත් ඕනෑම හේතුවක් නිසා අසාමාන්‍ය වන ගනුදෙනු.
- ගනුදෙනුව, ගනුදෙනුකරුගෙන් පිළිබිඹු වන මූල්‍ය තත්වය සමඟ හෝ සුපුරුදු ක්‍රියාකාරකම් රටාව සමඟ නොගැලපෙන බව පෙනීම.
- පැහැදිලි කළ නොහැකි ලෙස හදිසියේ සිදු වූ ධනයේ වැඩි වීම.

- ගනුදෙනුව, කර්මාන්තයට අදාළ සාමාන්‍ය පැවැත්මෙන් පරිබාහිර ලෙස පෙනීම හෝ ගනුදෙනුකරුට ආර්ථික වශයෙන් වාසිදායක බවක් නොපෙනීම.

- ප්‍රකාශිත අරමුණු සඳහා ගනුදෙනුව අනවශ්‍ය ලෙස සංකීර්ණ වීම.

- ව්‍යාපාරයෙන් අයත් කරගැනීමට අපේක්ෂිත දේ සමඟ ව්‍යාපාරයේ ක්‍රියාකාරකම් නොගැළපීම.

- ගනුදෙනුව සඳහා තාර්කික ආර්ථික අරමුණක් නොමැති බවක් හෝ සම්බන්ධිත සංවිධානයේ ප්‍රකාශිත ක්‍රියාකාරකම් සහ ගනුදෙනුවේ අනෙක් පාර්ශවයන් අතර කිසිදු සම්බන්ධයක් නොමැති බවක් පෙනෙන්නට ඇති ලාභ නොලබන හෝ පුණ්‍යායතන සංවිධානයක් ගනුදෙනුවට සම්බන්ධ වීම.

**විවිධ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර අංශ සඳහා සැක කටයුතු දර්ශක (අවදානම් දර්ශක)**

**කැසිනෝ සහ සූදු ගෙවල්**

- ගනුදෙනුකරුවන් විසින් කිසිදු ක්‍රීඩාවක නොයෙදී හෝ සූදු ඔට්ටු ඇල්ලීම අවම වශයෙන් සිදු කරමින් චිපයන් මිලදී ගැනීම සහ නැවත ඒවා කැසිනෝ ව්‍යාපාරය වෙත ලබා දී මුදල් ලබා ගැනීම හෝ කැසිනෝ ව්‍යාපාරය වෙත මුදල් තැම්පත් කර නැවත එකී මුදල් ඉවත් කර ගැනීම.

- ගනුදෙනුකරු විසින් ජයග්‍රහණය කරන ලද මුදල් හෝ තැම්පතු මුදල් තෙවන පාර්ශවයක් වෙත විවිධාකාරයෙන් ගෙවන ලෙස කරනු ලබන ඉල්ලීම්.

- එකම ප්‍රතිලාභී හිමිකරුවෙකු වෙත සිය ගෙවීම් සිදු කරන ලෙස සූදු ක්‍රීඩාවේ යෙදෙන විවිධ පුද්ගලයින් කරනු ලබන ඉල්ලීම්.

- ඒකිනෙකා අතර හිලව් කිරීමේ ඔට්ටු ඉදිරිපත් කිරීම මගින් සහයෝගිව ක්‍රියා කරනු ලබන බවට පෙනී යන සූදුවේ නියැලෙන්නන්.

- ගනුදෙනුකරු නිසි පරිදි හඳුනා ගැනීමේ හෝ වෙනත් වාර්තා තබා ගැනීමේ නියමයන් මගහැරීම සඳහා කැසිනෝ චිපයන් හෝ වෙනත් උපකරණ මිලදී ගැනීමට හෝ මුදල් බවට හරවා ගැනීම සඳහා පවතින ව්‍යුහය වෙනස් කිරීම.

- සූදු හා ඔට්ටු ක්‍රීඩා කරන උපකරණ වෙත මුදල් යොදවා අවම හෝ සැබෑ සූදුවකින් තොරව එම මුදල් නැවත ලබා ගැනීම.

- ගනුදෙනුකරුවන් කැසිනෝ සේවකයින් සමඟ මිතුරු වීම හෝ මිතුරු වීමට උත්සාහ කරයි.

- ගනුදෙනුකරුවෙකුට තුන්වන පාර්ශවයක් විසින් මුදල් මුදල් සපයන බව පෙනී යයි.

- සුපුරුදු ගනුදෙනුකරුවෙකු විසින් සිදු කරන ගනුදෙනු ප්‍රමාණය සහ වාර ගණන විශාල ලෙස හෝ වේගයෙන් ඉහළ යාම.

- සූදු ඔට්ටුවල දී සිටින පුද්ගලයන්ගේ මූල්‍ය තත්වය හෝ රැකියාව ඔවුන්ගේ ඔට්ටු ඇල්ලීමේ ක්‍රියාකාරකම් සමග නොගැලපීම.

- ජයග්‍රහණය කල සූදු ක්‍රීඩකයන්ගේ ටිකට්පත් මිලට ගැනීම.

- ජයග්‍රහණය කල සූදු ක්‍රීඩකයන්ගේ ජැක්පොට් හෝ ලොතරැයි ටිකට්පත් වැඩි මුදලකට මිලදී ගැනීම.

- සූදුවකින් තොරව මුහුණත වටිනාකම කුඩා මුදල් නෝට්ටු සඳහා මුහුණත වටිනාකම වැඩි මුදල් නෝට්ටු විශාල ප්‍රමාණයක් හුවමාරු කර ගැනීම.

- විශාල ජයග්‍රහණ සඳහා නිතර හිමිකම් ඉදිරිපත් කිරීම.

- ගනුදෙනුකරු සූදු ක්‍රීඩා වලට සහභාගී නොවන නමුත් පැමිණ බලා සිටීම හෝ පරිශ්‍රය අවට සැරිසැරීම.

- චිපයන් මගින් හෝ වෙනත් ආකාරයකින් සැලකිය යුතු වටිනාකම් වෙනත් ගනුදෙනුකරුවන් වෙත මාරු කිරීම.

- ගනුදෙනුකරුවන් සඳහා සූදු ඔට්ටු ඇල්ලීමට ආපසු ගෙවීමේදී වට්ටම් සහිතව මුදල් ණයට දීම.

■ සූදු ක්‍රීඩාවේ යෙදෙන කාල පරාසය තුල අපේක්ෂිත මුදල් අහිමිවීමේ අඩු අවදානමක් යටතේ විශාල අරමුදල් ප්‍රමාණයක් අත් කර ගැනීමට හැකිවන අයුරින් සූදු කටයුතු වල නිරත වීම සඳහා ඇති සූදු ක්‍රමවේදයන්.

■ ගනුදෙනුකරුවන් හඳුනාගැනීමේ අවශ්‍යතාවයන් සපුරාලීමට තොරතුරු සැපයීම සඳහා අකමැත්තක් දක්වන ගනුදෙනුකරුවන් හෝ සැක සහිත හෝ තහවුරු කර ගත නොහැකි හඳුනාගැනීමේ තොරතුරු සපයනු ලබන ගනුදෙනුකරුවන්.

**නිශ්චල දේපළ අනුයෝජිතයන්**

■ ගනුදෙනුකරු විසින් ඥාතියෙකු (කලත්‍රයා හැර) හෝ තමන් යටතේ සිටින වෙනත් පුද්ගලයෙකු වැනි නාමිකයෙකුගේ නමින් හෝ බාල වයස්කරුවන්ගේ හෝ ගිවිසුමකට එළැඹීම සඳහා හැකියාවක් නොමැති තැනැත්තන් නැතිනම් එවැනි මිලදී ගැනීම් සිදු කිරීම සඳහා ආර්ථිකමය හැකියාවක් නොමැති වෙනත් පුද්ගලයන්ගේ නමින් දේපළ අත්කර ගැනීම/ මිලදී ගැනීම.

■ ගනුදෙනුකරු විසින් ප්‍රතිලාභී හිමිකරුගේ අනන්‍යතාවය සැගවීමට උත්සහ කිරීම හෝ ප්‍රතිලාභියාගේ අනන්‍යතාවය සැගවීම සඳහා ගනුදෙනුව ව්‍යුහගත කරන ලෙස ඉල්ලා සිටීම.

■ ගනුදෙනුකරු ආවරණ සමාගමක් වීම සහ සමාගමේ නියෝජිතයා ප්‍රතිලාභී හිමිකරුගේ අනන්‍යතාවය හෙළිදරව් කිරීමට අකැමැති වීම.

■ ගනුදෙනුකරු විසින් ලබාදී ඇති ලිපිනය නොදන්නා ලිපිනයක් වීම, සාවද්‍ය බවට පෙනී යෑම හෝ එය හුදෙක් හුවමාරු ලිපිනයක් පමණක් වීම.

■ ගනුදෙනුකරු දේපළ මිලදී ගනු ලැබුවත්, අදාළ මිලදී ගැනීමෙන් පසු එම දේපළ දීර්ඝ කාලයක් පුරාවට භාවිත කර නොමැති බවක් පිළිබිඹු වීම.

■ දේපළ සඳහා ගෙවීම් කරන පුද්ගලයා දේපළ භාවිත කරන පුද්ගලයාගෙන් වෙනස් වන අවස්ථා.

■ ගනුදෙනුකරු විසින් අවසාන මොහොතේදී මිලදී ගැනීමේ පාර්ශවයේ නමට වෙනත් නමක් ආදේශ කිරීම පිළිබඳව සැහීමකට පත්වන අයුරින් හේතු පැහැදිලි නොකිරීම.

■ ගනුදෙනුකරු විසින් ව්‍යවහාර මුදලින් සැලකිය යුතු ප්‍රමාණයේ මූලික ගෙවීමක් සහ ඉතිරි මුදල අසාමාන්‍ය මූලාශ්‍රයකින් හෝ අක් වෙරළ බැංකු ගනුදෙනුවක් ලෙස ලබාදීම.

■ ගනුදෙනුකරු විසින් දේපළ පරීක්ෂා කිරීමෙන් තොරව මිලදී ගැනීම. මෙමගින්, ගනුදෙනුකරු දේපළ සඳහා මුදල් යෙදවීම පමණක් බවත්, දේපළෙහි පිහිටීම හෝ වෙනත් ගති ලක්ෂණ කෙරෙහි එතරම් සැලකිල්ලක් නොදක්වන බවත් තහවුරු වීම.

■ ඉතා කෙටි කාලසීමාවක් තුළ දී බොහෝ දේපළ මිලදී ගැනීම සහ එම එක් එක් දේපළෙහි පිහිටීම, තත්ත්වය සහ අපේක්ෂිත අලුත්වැඩියා පිරිවැය ආදිය පිළිබඳ අඩු සැලකිල්ලක් දැක්වීම.

■ දේපළ කළමනාකරණ සේවා සපයනු ලබන දේපළක් සම්බන්ධයෙන්, ආකෘතිය වෙනස් අදාළ හෝ නිවාස වැඩිදියුණු කිරීමට අදාළ ඉහළ වටිනාකමකින් යුතු ඉන්වොයිසි පත්‍ර සඳහා ව්‍යවහාර මුදලින් ගෙවීම් කර ඇති බවට ගනුදෙනුකරු හඳුනාගෙන තිබීම.

■ ගනුදෙනුකරු විසින් පවත්වාගෙන යනු ලබන බවට දැන සිටින ව්‍යාපාරික කටයුත්ත සමඟ ගනුදෙනුව නොගැළපීම.

■ දේපළෙහි සැබෑ හෝ වෙළඳපල වටිනාකමට වඩා සැලකිය යුතු වෙනත් වටිනාකමකින් යුතුව ගනුදෙනුවට එළඹීම (වඩා ඉහළ හෝ පහළ අගයකින්).

■ එකම පාර්ශව අතර ඉහළ මිලක් යටතේ නැවත නැවත එළැඹෙන ගනුදෙනු මාලාවක් ලෙස දේපළ අලෙවි කිරීම.

■ දේපළ මිලදී ගනු ලබන්නා විසින් දේපළ වටිනාකමට වඩා වැඩි ඉතා ඉහළ අගයකින් යුත් ණය මුදලක් ලබා ගැනීම.

■ ගනුදෙනුකරු විසින් හදිසියේ ගනුදෙනුව අවලංගු කිරීම/සම්පූර්ණ වීමට පෙරාතුව අත්හැර දැමීම සහ තමා වෙත හෝ යම් තුන්වන පාර්ශවයක් වෙත ප්‍රතිපූර්ණ කරන ලෙස ඉල්ලා සිටීම.

■ ගනුදෙනුකරු විසින් දේපළ මිලදී ගැනීම සඳහා ව්‍යවහාර මුදලින් (විද්‍යුත් මුදල් ප්‍රේෂණ ද ඇතුලත්ව) ගෙවීම් සිදු කිරීම. විශේෂයෙන්ම අදාළ දේපළ ඉහළ වටිනාකමකින් යුතු වීම හෝ ගනුදෙනුකරුගේ දැන සිටින්නා වූ පරිචය සමඟ එම ගනුදෙනුව නොගැළපීම සහ මිලදී ගැනීමට අදාළ අරමුදල් අක් වෙරළ රාජ්‍යකින් වූ ප්‍රේෂණයක් වීම

**මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳුන්**

**ගනුදෙනුකරු සහ ගනුදෙනුකරුගේ හැසිරීම:**

■ ගනුදෙනුකරු ඔහුගේ සුපුරුදු ගනුදෙනු රටාවට පටහැනි ගනුදෙනුවක් හෝ ගනුදෙනු පැවැත්වීම.

■ වටිනා ගල් / ලෝහ හෝ ස්වර්ණාභරණ නිෂ්පාදන මිලට ගන්නා හෝ විකුණන සුපුරුදු ගනුදෙනුකරුගේ මූල්‍ය තත්වයට හෝ ගනුදෙනු රටාවට පටහැනි ගනුදෙනුවක් හෝ ගනුදෙනු සිදු කිරීම.

■ ගනුදෙනුකරු අසාමාන්‍ය ගෙවීම් ක්‍රමයක් යොදාගනිමින් වටිනා ගල් / ලෝහ හෝ ස්වර්ණාභරණ සඳහා ගෙවීම් සිදු කිරීම.

■ ගනුදෙනුකරු කිසිදු ආර්ථිකමය ලෙස කිසිදු තර්කිකභාවයකින් තොරව විදේශ මුදල් භාවිතා කරමින් නිරන්තරව හෝ විශාල ගනුදෙනු සිදු කිරීම.

■ ගනුදෙනුකරු විසින් ගනුදෙනුකරු නිසි පරිදි හඳුනා ගැනීම සඳහා පවතින අවම සීමාව අසන්න වන එහෙත් ඉක්මවා නොයන ගනුදෙනු නිරන්තරයෙන් සිදු කිරීම හෝ විශේෂයෙන් කෙටි කාලසීමාවක් තුල එවන් ගනුදෙනුවල නිරත වන්නේ නම්, එවැනි අවස්ථා වල දී එම ගනුදෙනු වල එකතුව සැලකිය යුතු ය.

■ නීත්‍යානුකූල ව්‍යාපාරික අරමුණකින් තොරව, අරමුදල්වල හිමිකරු නොවන තෙවන පාර්ශවයක් විසින් වටිනා ගල් / ලෝහ හෝ ස්වර්ණාභරණ නිෂ්පාදනයක් සඳහා ගෙවීම් කිරීම.

■ ගනුදෙනුකරුවන් නිසි පරිදි හඳුනාගැනීමේ සහ වාර්තා තබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා ගනුදෙනුකරු විසින් ව්‍යාජ, වංචනික හෝ අසත්‍ය හඳුනාගැනීමේ ලේඛන භාවිත කරන බවට සැක කිරීම.

■ ගනුදෙනුකරු මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ බැඳීයාවන් සහ අභ්‍යන්තර අනුකූලතා ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි හෝ පාලනයන් පිළිබඳව අසාමාන්‍ය ලෙස සැලකිලිමත් වීම හෝ විමසීම.

■ ගනුදෙනු සම්බන්ධයෙන් ඉහළ රහස්‍යභාවයක් පවත්වා ගැනීමට ගනුදෙනුකරු උත්සාහ දැරීම. උදාහරණයක් ලෙස සාමාන්‍යයෙන් ව්‍යාපාරය තුල සිදු කරන වාර්තා කිරීම් සිදු නොකර ලෙස ඉල්ලා සිටීම.

■ ගනුදෙනුකරු වටිනා ගල් / ලෝහ හෝ ස්වර්ණාභරණ නිෂ්පාදන මිලදී ගැනීම සඳහා යොදා ගන්නා මුදල් උපයාගත් ආකාරය පිළිබඳව සිදු කරන විමසීම් වලට පිළිතුරු දීමෙන් වැළකී සිටීම.

■ ගනුදෙනුකරු අපරාධ / ත්‍රස්තවාදී ක්‍රියාවන්ට සම්බන්ධ පසුබිමක් පවතින බවට ප්‍රසිද්ධියක් ඉසිලීම.

■ ගනුදෙනුකරු මුදල් විශුද්ධිකරණය/ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාකාරකම් සඳහා සහය දක්වන රටකට හෝ ආයතනයකට සම්බන්ධ බව පෙනී යාම.

ඉහත සඳහන් කළ දර්ශකයන්ට අමතරව, මැණික් හා ස්වර්ණාභරණ අලෙවිකරුවන්ගේ දැනුවත්බව වැඩි දියුණු කිරීම උදෙසා පහත සඳහන් සැපයුම්කරුවන් සහ සැපයුම්කරුවන්ගේ හැසිරීම් පිළිබඳ සැක සහිත දර්ශක විස්තර කෙරේ;

**සැපයුම්කරු සහ සැපයුම්කරුගේ හැසිරීම:**

■ සැපයුම්කරු වටිනා මැණික් ගල් / ලෝහයේ වටිනාකම අවතක්සේරු හෝ අධිතක්සේරු වන ලෙස ඉන්වොයිස් කිරීම.

■ වටිනා මැණික් ගල් / ලෝහ සම්බන්ධ ගනුදෙනු වලදී සැපයුම්කරු තෙවන පාර්ශව භාවිතා කිරීම. උදා: කිසිදු නීත්‍යානුකූල ව්‍යාපාරික අරමුණක් නොමැතිව සැපයුම්කරු හා සම්බන්ධ නොවන තෙවන පාර්ශවයකට ගෙවන මුදල්.

■ නීත්‍යානුකූල ව්‍යාපාරික අරමුණක් නොමැතිව සැපයුම්කරු හා සම්බන්ධතාවයක් නොමැති තෙවන පාර්ශවයකින් ලබා ගන්නා වටිනා ගල් / ලෝහ / ස්වර්ණාභරණ නිෂ්පාදන.

- වටිනා ගල් / ලෝහ / ස්වර්ණාභරණ නිෂ්පාදනවල ව්‍යාජ සම්භවයක් ඇති බව පෙනීම.
- සැපයුම්කරු අසාමාන්‍ය ලෙස මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ බැඳීයාවන් පිලිබඳව සැලකිලිමත් වීම.
- ගනුදෙනු සම්බන්ධයෙන් ඉහළ රහස්‍යභාවයක් පවත්වා ගැනීමට සැපයුම්කරු උත්සාහ කිරීම සහ සාමාන්‍ය ව්‍යාපාර වාර්තා තබා නොගන්නා ලෙස ඉල්ලා සිටීම.
- ගනුදෙනුකරු ප්‍රතිලාභී හිමිකරුවන් හෝ සඵලදායි පාලන හිමිකාරිත්වය අනාවරණය කිරීමට අකමැති වීම.
- සැපයුම්කරු අසාමාන්‍ය ගෙවීම් මාධ්‍යයක් තුලින් මැණික් / ස්වර්ණාභරණ සඳහා ගෙවීම් කරීමට ඉල්ලා සිටීම. උදා: තෙවන පාර්ශවයකගේ බැංකු ගිණුමකට මුදල් තැම්පත් කරන ලෙස ඉල්ලා සිටීම, තෙවන පාර්ශවයකට මුදල් භාර දෙන ලෙස ඉල්ලීම යනාදිය.
- දියමන්ති සඳහා;
    - ඔප නොදැමූ දියමන්ති වලංගු කිම්බර්ලි ක්‍රියාවලියකින් තොරව හෝ පොදුවේ පිළිගතහැකි සහතික කිරීමක් රහිත වීම
    - ඔප නොදැමූ දියමන්ති නැව්ගත කිරිමේදී වලංගු කිම්බර්ලි සහතිකයක් ඉදිරිපත් කර නොමැති වීම
    - කිම්බර්ලි සහතිකය ව්‍යාජ එකක් ලෙස පෙනීම.
- සැපයුම්කරු මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමේ ඉහළ අවදානමක් සහිත රටක්/ආයතනයක් හෝ ත්‍රස්තවාදියෙකු ලෙස නම් කර ඇති පුද්ගලයෙක් සමග සම්බන්ධ බව පෙනී යාම.
- පැහැදිලි ආර්ථික හේතුවක් නොමැතිව සැපයුම්කරු මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමේ ඉහළ අවදානමක් සහිත රටක් හරහා වටිනා ගල් / ලෝහ ප්‍රවාහනය කිරීම.